# 2018 යල පෙර කන්න රැස්වීම - ගල්ඔය දකුණු ඉවුර දමන ව්‍යාපාරය

දිනය - 2018 03 27

ස්ථානය - නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය

වේලාව-පෙ.ව - 9: 30

මූලිකත්වය - නේවාසික ව්‍යාපෘති කළමණාකරු දමන

01 02 03 04 05 06 07 08 09 10 11 12 13 14 15
17 APR 2018
වාරිමාර්ග කළමනාකරු

රජයේ නිළධාරි මහතුන්

| අනු අංක | නම | තනතුර | ස්ථානය |
|---|---|---|---|
| 01 | එස් එල් ඒ අන්සාර් | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | දමන |
| 02 | ඒ ලියනගේ | වාරිමාර්ග ඉංජිනේරු | අම්පාර |
| 03 | එම් එෆ් ඒ සහිර් මහතා | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ මහතා | අම්පාර |
| 04 | ඔවි අශෝකා නාලනි මිය | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | දමන |
| 05 | යූ පි ආර් ඩී උයන්වත්ත මිය | ජනපද නිළධාරි | එරගම |
| 06 | අයි එම් ටී එම් බණ්ඩාර මහතා | වාරි: ඉංජිනේරු සහකාර | දමන |
| 07 | ඩබ් එම් ඒ බණ්ඩාර මහතා | සහකාර වැවිලි කළමණාකරු | හිඟුරාණ |
| 08 | පි ඩී අයි රම්‍යලතා | සංවර්ධන සහකාර | දමන |
| 09 | ඒ කාබුදීන් මහතා | සංවර්ධන නිළධාරි | දමන |
| 10 | ජේ එම් අයාස් | සංවර්ධන නිළධාරි | දමන |
| 11 | ඒ කේ ශ්‍රියාණි අතපත්තු මිය | කෘ ප නි ස | දමන |
| 12 | ඩබ් එන් ඒ අයිරා මිය | කෘප නි ස | දමන |

ගොවි නියෝජිත මහතුන්

| අනු අංක | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | ඩී එම් තිලකරත්න මයා | සභාපති | කීණවත්ත ගොවි සංවිධානය |
| 02 | කරුණාරත්න ගනේගෙදර | ලේකම් | තිස්සගොවි සංවිධානය |
| 03 | යූ පි විජේසිංහ මයා | සභාපති | ගැමුනු ගොවි සංවිධානය |
| 04 | ආර් එම් පියතිලක මයා | සභාපති | ලක්මිණි ගොවි සංවිධානය |
| 05 | ආර් වයි එම් හින්බණ්ඩා මයා | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 06 | එල් පී පියතිස්ස මයා | සභාපති | සේනානායක ගොවි සංවිධානය |
| 07 | එම් පි ජයසේන මයා | ලේකම් | සේනානායක ගොවි සංවිධානය |
| 08 | ආර් එම් විජේසිංහ මයා | නියෝජිත | ගල්මඩුව ගොවි සංවිධානය |
| 09 | ඩබ් එල් ඒ කැලුම් ප්‍රියන්ත මයා | භාණ්ඩාගාරික | ගැමුණු ගොවි සංවිධානය |
| 10 | එල් ඩබ් සුනිල් එඩ්වඩ් මයා | ලේකම් | දිවියාගල ගොවි සංවිධානය |
| 11 | ඒ එම් පි අධිකාරි මිය | ලේකම් | ලක්මිණි ගොවි සංවිධානය |
| 12 | ඩබ් ආර් ජයතිලක මයා | ලේකම් | පැරකුම් ගොවි සංවිධානය |
| 13 | ආර් කේ බි එම් සමන්ත මයා | සභාපති | තිස්ස ගොවි සංවිධානය |
| 14 | ඩී එම් විජේපාල මයා | නියෝජිත | වරිපතන්චේන ගොවි සංවිධානය |
| 15 | එච් ඒ ධර්මසේන මයා | නියෝජිත | වරිපතන්චේන ගොවි සංවිධානය |
| 16 | ඊබ්‍රාහිම් මයා | සභාපති | එරගම ගොවි සංවිධානය |
| 17 | යූ පි කේ එන් සේනාධීර මිය | ලේකම් | කීණවත්ත ගොවි සංවිධානය |
| 18 | ඔවි ඒ සේනානායක මයා | නියෝජිත | දිවියාගල ගොවි සංවිධානය |
| 19 | ඒ පි සමින්ද මයා | සභාපති | හෙළගම්පුර ගොවි සංවිධානය |
| 20 | ඒ ආර් එම් අලියාර් මයා | භාන්ඩාගාරික | මුදලියාර් ගොවි සංවිධානය |
| 21 | ඒ එල් එම් ඉස්මයිල් මයා | ජල පාලක | මුදලියාර් ගොවි සංවිධානය |
| 22 | කේ නලිර් මයා | ලේකම් | එරගම ගොවි සංවිධානය |
| 23 | ටී පි හේමපාල මයා | උ/ ලේකම් | මිගහපල්ලම ගොවි සංවිධානය |
| 24 | කේ ඥාණසිරි මයා | සභාපති | මහසෙන් ගොවි සංවිධානය |
| 25 | ඩබ් පි කරුණාරත්න මයා | භාණ්ඩාගාරික | මහසෙන් ගොවි සංවිධානය |
| 26 | එම් පි මුණිදාස මයා | සභාපති | මිගහපල්ලම ගොවි සංවිධානය |

2018 යල පෙර කන්න රැස්වීම සාර්ථක කර ගැනිම සඳහා පැමිනි වාරිමාර්ග ඉංජිනේරු ඉංජිනේරු සහකාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනපද නිළධාරි ගල්ඔය වැව්පි සමාගමේ වගා කළමණාකරු ඇතුලු සියලුම නිළධාරි මහත්ම/මහත්මින්ද ගොවි සංවිධාන නියෝජනය කරමින් පැමිණි සියලුම නිළධාරි හා නියෝජිත මහත්ම/මහත්මින්ද මා පිලිගනු ලබනවා·

දිස්ත්‍රික් ලේකම්තුමන් සමග පසු ගිය දින කිහිපයක දි පැවති රැස්වීම් වලින් අනතුරුව දකුණු ඉවුර ව්‍යාපාරයට 100% ක් ජලය ලබා දීමට තීරණය වී ඇති අතර ඒ පිලිබදව වාරිමාර්ග දෙපාර්තමේන්තු නිළධාරීන් දැනුවත් කරනු ඇති·

විශේෂයෙන් අද දිනයේ ජල ප්‍රශ්නයට විසදුමක් ලෙස ලොකු එැණු වගා කිරිමේ ැඩසටනක් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය හා ජල කළමනාකර අමාත්‍යාංශය එක්ව කටයුතු සිදු කිමට බලාපොරොත්තු වන අතර ඒ පිබදව මූලික දැනුවත් කිරිමක් සඳහා පැමිණ සිටින නිළධාරින් සඳහා මූලින්ම අවස්ථාව ලබා දෙමි·

ලොකුළුණු වගාව පිලිබදව දැනුවත් කිරිමෙන් අනරුව පෙර කන් න රැස්විමේ කටයුතු ආරම්භ විය·

## ආයතන සංවර්ධන කටයුතු- එස් එල් ඒ අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමණාකරු දමන

2017 වර්ෂයේ ගිනුම් විසණනය කිරිම සඳහා විසණකවරයෙකු සොයා ගන්නා ලෙස මා කලින් දැවක් කර ඇති අකර ඒ අය ලවා ගොවි සංවිධාන ගිනුම් විගණනය කරවා ගැනීමට කටයුතු සිදු කරන ලෙසක් එම වාර්තාවට ගොවි සංවිධානය සතු සියලු වත්කම් ඇතුලත් කරවා ගැනීමට කටයුතු කරන ලෙසක් ගොවි සංවිධාන 10 ක නිලවරණ පැවැත්විය යුතුව ඇති බැවින් එම ගොවි සංවිධාන මෙම වර්ෂයේ ජුනි ජූලි මාස වල ඒ සඳහා සුදානම් වන ලෙසත් 2017 වර්ෂයේ මාසික වාර්තා කාර්යාලයට ලබා නොදුන් ගොවි සංවිධාන ඒවා ලබා දිමට කටයුතු කරන ලෙසත් දැනුම් දෙමි·

| ඉදිරිපත් කල අය | ගැටලුව | විසදුම | වගකිම | කාලය |
|---|---|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ ලියනගේ මහතා වාරි·ඉංජිනේරු | සේනානයක සමුද්‍රයේ ජල ධාරිතාවය අද වන විට අක්කර අඩි 137 400 ක් වේ· දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දින වල පැවති සාකච්ජාවලින් පසුව පවතින ජල තත්වය අනුව වගා කල හැක්කේ අක්කර 17000 ක් පමනක් බවත් ඉදිරියේ දි තවත් වැසි ප්‍රමාණයක් අපේක්ෂාවෙන් එම ප්‍රමාණය අක්කර 22000 ක් දක්වා වගා කිරීමට තීරණය කලා ඒ අනුව දකුණු ඉවුර කොටසසෙන් අක්කර 7000 ක් හා බස්නා ජලයෙන් අක්කර 1194 ක් සමග මුලු ප්‍රමාණය 8194කි අප්‍රේල් 15 දින ජලය නිකුත් කිරිමට කටයුතු කරන අතර නාස්තිය අවම කර සියලු ගොවින්ට යහපත් වන ආකාරයට වගා කටයුතු වල නිරත වන ලෙස දැනුම් දෙමි· | | | |
| සස් එල් ඒ අන්සාර් නේවාසික ව්‍යාපෘති කළමනාකරු | මෙම ව්‍යාපාරයේ මුලු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 4202 කින් උක් වගාව හෙක්ටයාර් කොපමණද | දිගවාපිය නිත්ත ප්‍රදේශත් සමග දැනට වගා කර ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 2800 ක් ඇති අතර අලුතින් වගා කිරිම සඳහා බිම් සැකසිමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත හේතුව පසේ තෙතමනය යම් මට්ටමක ඇති නිසා එය පහසුවක් වී තිබීමයි කෙසේ වෙතත් අලුතින් ආරම්භ කරන වගාවේ වගකීම සමාගම භාර | ගල්ඔය වැවිලි සමාගම | |

| | | | | |
|---|---|---|---|---|
| | | ගන්නා බවද සදහන් කිරිමට කමතියි | | |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | දමන ව්‍යාපාරයට ගැටලුවකින් තොරව ජලය ලබා දෙන නිසා වගාවේ නිරත විය හැකියි· නමුත් එම වාසනාව අන් අයගේ යහපත සඳහා යෙදවීමට නම් ඉදිරි කන්නයේ දි වගා නොකරන පිරිසට ඔබ විසින් බීජ වී ලබා දිය යුතු වේ· එයයි වැදගත් වන්නේ ඒ නිසා පිරිසිදු බීජ වී භාවිතා කර තෙතමනය 12·5 % දක්වා අඩුකර ගබඩා කර තබන්න· එමෙන්ම රුපියල් 400 ක් වැනි පොඩි මුදලක් වැය කර ලියාපදිංචිය ද ලබා ගන්න· වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වී වගාව සඳහා ලබා දි ඇත්තේ සුදුසුම කාලයයි එය අක්දැකීම් බහුල ඔබ දැනුවත්ව සිටිනවා· ජලය සීමාකාරී සාධකයක්වී ඇති බැවින් එය ආරක්ෂා කිරීමට අප කැපවිය යුතුයි මෙම කන්නය සඳහා මාස 3 ,3 1/2 වී පමනක් භාවිතා කරන්න· බිම් සැකසීමේ කටයුතු ජලය ලබා දෙන තෙක් නොසිට කලින්ම ආරම්භ කරන්න· අවශ්‍ය උපදෙස් ක්ෂේත්‍රයේ සිටින කෘෂිකර්ම උපදේශක මහතුන්ගෙන් ලබා ගන්න· | | | |
| ගොවිජනසේවා දෙපාර්තමේන්තුව කෘපනිස ශ්‍රියාණි මිය ශ්‍රියාණි අතපත්තු මිය | 2017/18 මහ කන්නයේ දි අහස් දියෙන් වගා කර විනාශ වූ ගොවීන් වෙනුවෙන් රු: 40000 ක වන්දි මුදලක් ගෙවීමට තිරණය කර ඇති අතර මේ දින වල ඒ සඳහා ක්ෂේත්‍ර පරික්ෂා සිදු කරන බැවින් අදාල ගොවීන් සම්බන්ධ වන ලෙසත් මහ කන්නයේ දි ජල ගිගයෙන් විනාශ වූ කුඹුරු සඳහා රු: 10000 ක වන්දි මුදලක් ලබා දිමට සුදානම් කර ඇති අතර ඒ සඳහා ද ඉදිරිපත් වන්න එමෙන්ම අනුරාධපුර අලුත් සමල මංගල්‍යය සඳහා ආධාර උපකාර කල සියලු දෙනාට ස්තුතිය පිරිනමන අතර සහභාගි කරවා ගැනීම සම්බන්ධව ඉදිරියේ දි දැනුම් දෙන අතර 2018 යල කන්නය සඳහා පොහොර සහනාධාරය ක්‍රියාත්මකයි· ඒ සඳහා කන්න රැස්වීම් දිනවකවානු සමග අප යුහුසුලුව කටයුතු සුදානම් කරන බව දැනුම් දිමට කැමතියි· | | | |
| ජනපද නිළධාරි යු පී ආර් ඩී උයන්වත්ත මිය | බලපත්‍ර නොමැති ඉඩම් වලට බලපත්‍ර ලබා දිම සඳහා මේ දින වල සමීක්ෂණ කටයුතු සිදු කරන බැවින් ඒ වාට සහභාගි වී ලියාපදිංචි වන්න නැති නම් බලපත්‍ර ලබා ගැනීමට අපහසුයි | | | |
| ගල්ඹය වැව්ලි සමාගම බණ්ඩාර මහතා | ගල්ඹය වැව්ලි සමාගම ආශ්‍රිතව ගොවි පවුල් 5000 ක් පමණ ජීවත් වන අතර සේවක පිරිස මේ වන විට 900ක් පමණ වේ ඒ නිසා මෙම ආයතනයද විශාල සේවාවක් ඉටු කරන ස්ථානයක් ·පවතින වගාවට මෙන්ම අලුත් වගාව සඳහා ද ජලය ලබ ාදි මෙම වගාව ව්‍යාප්තකර ලිමට කටයුතු කරන ලෙස ආයතනය වෙනුවෙන් ඉල්ලිමක් කරනවා· මේ දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුව කිසිදු ගැටලුවකින් තොරව සමාගමට ජල පහසුකම් ලබා දුන් අතර එක් වතාවක් හෝ විනාශ වීමට ඉඩ නොතැබීම සමබන්දව ස්තූතිය පිරිනමන අතර ඉදිරියේදිත් අප එම සහය බලාපොරොත්තු වෙනවා· කෙසේ වෙතත් ගැටලු සහිත ස්ථාන සඳහා පොම්ප මාර්ගයෙන් ජලය ලබාගෙන අප වගා කටයුතු වල නිරත වනවා<br>ලංකාව පුරා විසිරි ඇති උක් සමාගම් සියල්ල එකතු වී කල ඉල්ලිමකට අනුව උක් ගොවීන්ට ද පෙහොර සහනාධාරය ලබා දිමට පියවර ගෙන තිබීමත් වගා රක්ෂණ ක්‍රමයක් හදුන්වා දි තිබීමත් ගොවීන්ගේ සතුටට කාරනයක් වේවි·<br>එන මැයි මාසයේ දි උක් ඇඹරිමේ කටයුතු ආරම්භ කරන බවත් සදහන් කිරිමට කැමතියි· | | | |

ඉහත ආයතන වල අදහස් යෝජනා සැලකිල්ලට ගෙන පහත සඳහන් පරිදි 2018 යල කන්නය සඳහා යෝජනා නේවාසික ව්‍යාපෘති කළමනාකාර මහතා විසින් ඉදිරිපත් කරන ලදි·

01 වී වගාව සඳහා යෝජිත බිම් ප්‍රමාණය හෙක්ටයාර් - 2275

අක්කර - 5619. 25

උක් වගාව සඳහා යෝජිත බිම් ප්‍රමාණය හෙක්ටයාර් - 1133 60

02 ඇලවල් ගොවින් වාරිමාර්ග

දෙපාර්තමෙන්තුව නඩත්තු වැඩ අවසන් කල යුතු දිනය - 2018 04 10

03 ජලය නිකුත් කිරීම - ආරම්භක දිනය - 2018 ·04· 15

- අවසාන දිනය - 2018.07 31

04 කන්නය සඳහා සුදුසු බෝග වර්ග - වී මාස 3, 3 1/2

05 වපුරා පැල සිටුවා අවසන් කල යුතු දිනය - 2018· 04· 30

06 මුර ක්‍රමය යටතේ ජලය සැපයීම - කම්ටු රැස්වීම් පවත්වා අවශ්‍ය අවස්ථා වලදී ජලය ලබා දීම

07 ට්‍රැක්ටර් හා ගවයින් යායෙන් ඉවත් කල යුතු දිනය - 2018· 04· 30

08 ඇලවේලි වලට හානි කිරීමේ දඩය -වා:මා:දෙ:තක්සේරුවට අනුව

09 ඇලවෙලි සුද්ද නොකිරීමේ දඩය - මීටර් 01 ක් සඳහා රු: 150. 0

10 ගොවි සංවිධාන සංවර්ධන අරමුදල :සලාරිස් - අක්කර 01කට රු: 150. 00

11 ඇලවේලි වල ගවයින් බැඳීමේ දඩය - එක් ගවයෙකුට රු: 500.

12 වගාවන් රක්ෂණය කල යුතු අවසාන දිනය - 2018· 04· 30

ඉහත සඳහන් යෝජනා 2018 යල කන්න සඳහා සුදුසු බවට තිස්ස ගොවි සංවිධානයේ ගරු ලේකම් කරුණාරත්න ගනේගෙදර මහතා යෝජනා කල අතර ස්ථිර කරන ලද්දේ පෙරුවලිකන්ඩම් ගොවි සංවිධානයේ ගරු ලේකම් ඒ එල් කේ ලෙබ්බේ මහතා විසිනි ·

ගොවි නියෝජිත අදහස් දැක්වීම

| | | | | |
|---|---|---|---|---|
| ඒ එල් කේ ලෙබ්බේ පෙරුවලිකරණ්ඩම් ගොවි සංවිධාන ලේකම් | පල්ලංඔයයෙන් ගලා යල ජලය පරක්කාඩි ඇනිකට් එක හරහා අක්කර 1500ක් පමණ අස්වැද්දීමට අවශ්‍ය ජලය ලබා ගැනීමේ හැකියාවක් පවතින බැවින් එය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස කල ඉල්ලීම | එක් ගොවි සංවිධානයකට යහපතක් වන විට තවත් පිරිසකට එය අයහපත් ආකාරයෙන් බලපායි නම් එය එතරම් සාර්ථක නැහැ එම නිසා එය පරික්ෂා කර බැලීමට එකඟ වීය | වා මා දෙ | |
| සුනිල් එඩ්වඩ් දිවියාගල ගොවි සංවිධානයේ ගරු ලේකම් | එසේ ජලය ලබා ගැනීමේ දි අප ගොවි සංවිධානයේ අක්කර ගණනාවක් යටවීමේ අවධානමක් පවතින බැවින් කුණු ඇල නිසි පරිදි ගොඩ දමා ජලය ලබා | | | |

| | | | | |
|---|---|---|---|---|
| | නොමැත | | | |
| යූ ජී විජේසිංහ ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති | තමන්ගේ ඇල කොටස් නිසි වේලාවට සුද්ද නොකිරීම | කන්න රැස්වීම් තීරණ වලට යටත් නොවන්නේ නම් ගොවි සංවිධානය හරහා ලබා දෙන සියලු වරප්‍රසාද අත්හිටුවීමට කටයුතු කල හැකියි | ගොවි සංවිධානය | පොහොර අයදුම්පත්‍ර සහතික කිරීමේ දී |
| ඒ ලියනගේ මහතා වාරිඃඉංජිනේරු | ඇලවල් සුද්ද නොකිරීම නිසා ජලය ලබා ගැනීමේ දී ඇතිවන ප්‍රමාදයන් ඇතිවීම | ඒ සදහා නැවත ජලය ලබාදීමෙට හැකියාවක් නොමැත | වා මා දෙ | |
| ඒ පී සමින්ද සභාපති හෙළගම්පුර ගොවි සංවිධානය | ආර් බී 18 ඇල ප්‍රතිසංස්කරනයට ගස් ඉවත් කිරීමේදී ගැටලු ඇතිවීම | අදාල ස්ථානයට ගොස් පරීක්ෂා කිරිමට එකග විය | වා මා දෙ | |
| ඩබ් ආර් ජයතිලක ලේකම් පැරකුම් ගොවි සංවිධානය | ආර් බී 6 ඇලේ පරණ බට යටින් ජලය ගලා යාම අලුතින් ඉදි කල පැති බැම්ම විනාශවී යාම ආර් බී 6 ඒ ඇලේ අගාවත උසින් පිහිටීම | පෝල් බට යටින් ජලය යාම පිලිබදව සොයා බැලීමටත් උස කොටස පහලට හාරා ගැනීම සදහා ජේ සී බී යන්ත්‍රයක් ලබා දීමටත් එකග විය | වා මා දෙ | ඉදිරි සතිය ඇතුලත |
| නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | පසු ගිය කන්න වල පොහොර භාවිතයේ දි කුඩු සහ කැට පිලිබදව ආන්දෝලනයක් තිබුනා කුඩු භාවිතය ඉක්මන් ප්‍රතිපල ලැබෙන බව සදහන් වුවත් කැට වලද ගැටලුවක් නැහැ එය ගසට උරා ගැනීම සිදු වන්නේ එක්වර නොවේ ඒ නිසා කැට පොහොර භාවිතය වඩාත් යෝග්‍යයි | | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | |
| ලලිත් ගුණරත්න උක් ගොවි සංවිධානයේ ගරු සභාපති | උක් ඉඩම් හරහා ගලා යන ඇල මාර්ග වලින් ජලය ලබාගෙනයි සුලු ප්‍රමාණයක් වී වගාව සිදු කරන්නේ· වී වගාව සදහා පමණක් ජලය නිකුත් කිරීම සිදු කරන්නේ නම් එය ගැටලුවක් වේවි · උක් වගාවෙන් ඉවත් වූ ගොවියෙකුගේ ජිවන තත්වය පිලිබදව ගැටලු පවතිනවා· උක් වගාවේ අතරමැද වගාවට වන හානි යකදි ගොවියාට ලැබෙන සහන සම්බන්ධව දැන ගැනීමට කැමතියි· අතිරේක බෝග වගාව සදහා රාජ්‍ය අනුග්‍රහය අවශ්‍යයි· ආර් බි 18 ,19 ඇලවල් වල ප්‍රතිසංස්කරණ කටයුතු නිසි පරිදි කර දිම තමයි වැදගත් වන්නේ· එහෙත් අනවශ්‍ය ලෙස ගෙඩි හැදෙන පොල් ගස් ඉවත් කිරිම අපරාදයක්· ඒ නිසා එවැනි සංවර්ධනයක් නොවේ ගොවින් බලාපොරොත්තු වින්නේ· අප මානුෂිකව සිතා කටයුතු කල යුතුයි· ඒ පිලිබඳව සොයා බලන ලෙස ඉල්ලනවා මුවන්ගල කීණවත්ත ගොවි සංවිධාන අක්‍රිය කර ඇති බව ගොවින් ප්‍රකාශ කරනවාඃ මෙම සංවිධාන නැවත බල ගැන්වීමට කල යුක්තේ කුමක්දැයි දැන ගැනිමට කැමතියි· | | සංවර්ධන කටයුතු කරගෙන යාමේදි රක්ෂිත වලඇති පොල් ගස් ඉවත් කර ඇති අතර අනවශ්‍ය ලෙස ගස් ඉවත් කර ඇද්දැයි සොයා බැලිමට තිරණය විය | අද දිනයේ දි |
| නේවාසික ව්‍යාපෘති | සංවර්ධන කටයුතු සිදු කිරිමේ දි අනවශ්‍ය ලෙස රක්ෂිත වල ඇති ගස් [illegible] කිරීම | | | |

| | | | | |
|---|---|---|---|---|
| | සොයා බලා කටයුතු කරමු·<br>ගොවි සංවිධාන අක්‍රිය කිරිමක් කිසිසේත් සිදු කර නැහැ ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූල ගොවීන් නිළධාරීන් ලෙස පත් කරන ලෙස පමණයි දැනුම් දි ඇත්තේ මේ පිලිබදව මා ප්‍රාදේශීය ලේකම්තුමන් ද දැනුවත් කර තිබෙනවා මෙය වරදවා තේරුම් නොගන්නා ලෙස ඉල්ලා සිටිනවා | | | |
| කේ ගනේගෙදර තිස්ස ගොවි සංවිධානයේ ගරු ලේකම් | කන්න රැස්වීම් යෝජනා සම්මත වුනා එම තිරණ වලට අනුව ගොවින්ට නිසි වේලාවට පොහොර පහළලන්ද ගබඩාවට ලබා ගැනිමට කටයුතු සගස්වන ලෙස කල ඉල්ලිම | | | |
| එල් පි ජයතිස්ස සේනානායක ගොවි සංවිධානයේ ගරු සභාපති | ආර් බී 6බී ඇලේ බන්ට් එක කඩාගෙන යාම | දින 4ක් සදහා බැකෝ යන්ත්‍රයක් ලබා දිම | වා මා දෙ | ඉදිරි සතිය තුල |
| ඩී එම් විජේපාල නියෝජිත වරිපතන්චේන ගොවිස ංවිධානය | ආර් බි 13 වී ආර් 12 ඇලේ අමුණ කඩා උක් ගොවීන් ජලය ගෙන යාම | ඒ පිලිබදව සොයා බැලිමට එකග විය | ගල්ඔය වැව්ලි සමාගම | |
| ආර් එම් පියතිලක ලක්මිණි ගොවි සංවිධානයේ ගරු සභාපති | කුණු ඇල ගොඩ නොදැමිම | මැෂින් එකක් එක් දිනක් ලබා දිය හැකියි | වා මා දෙ | ඉදිරි සතිය තුල |
| සේනානායක මහතා නියෝජිත දිවියාගල ගොවි සංවිධානය | ග්ලයිකොසෙට් තහනම ඉවත් කර නැවත ලබා දෙන ලෙස කල ඉල්ලිම | ඉදිරියේ දි නැවත සාකච්ජා කිරිමට තිරණය විය | | |

සාකච්ජාව සදහා වෙනත් කාරනා නොවූයෙන් අද දින පෙර කන්න රැස්විම සාර්ථක කර ගැනිමට පැමිණි සියලුම නිළධාරි මහත්ම/මහත්මින්ටත් ගොවි සංවිධාන සියලුම නිළධාරි හා නියෝජිත මහතුන්ටත් ලොකු ඇණු වගාව පිලිබදව දැනුවත් කිරිමට පැමිනි නිළධාරින් දෙපලටත් ශ්වාසික ව්‍යාපෘති කළමනාකාර මහතා ස්තුතිය පිරිනමමින් සභාවේ කටයුතු පෑව 1: 30 ට පමණ අවසන් කරන ලදි·

එස්· එල් · ඒ · අන්සාර්

නේවාසික ව්‍යාපෘති කළමනාකරු

දමන· S.L.A. Ansaar
Resident Project Manager(Act)
Gal-eya Right Bank
Damana.